**ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය සභාව.**
**--------------------------------------**
**මාතලේ දිස්ත්‍රික්කය.**
**----------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**
**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 20 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 22 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**1.2 මතය**
**------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ, පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**
**----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.**
**---------------------**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) එකතුව රු. 733,212 ක් වූ වත්කම් ශේෂ 04 ක් සහ එකතුව රු. 79,000 ක් වූ වගකීම් ශේෂ 02 ක සහ සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ වලදී ලැබී තිබුණු විෂයයන් 03 කට අයත් වත්කම් ඒකක 79 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ගිණුම් විෂයන් 03 ක වටිනාකම රු. 222,518 ක් වැඩියෙන්ද, ස්ථාවර තැන්පතු ගිණුමේ ශේෂය රු. 117,422 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඇ) ඉකුත් වර්ෂ කිහිපයක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණු රු.87,864 ක විගණන ගාස්තු ණයහිමි ශේෂයෙන් ඉවත්කර ගිණුම් නිවැරදි කර නොතිබුණි.

(ඇ) සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම මෙන්ම, ජල ගබඩා තොග සහ විදුලි ගබඩා තොග ශේෂ ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) 2002 වර්ෂයේදී සභාවෙන් ස්ථාන මාරු වී ගිය නිලධාරීයෙකුගේ ණය ශේෂය මත ලැබිය යුතු රු.23,300 ක පොලිය ගිණුම් වලින් අත්හැරී තිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

-----------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.49,995,064 ක් වූ ගිණුම් විෂයයන් 11 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තා වල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.5,013,462 ක අසමානතා නිරීක්ෂණය විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම**

-----------------

ඉකුත් වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණු රු. 1,842,869 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂයට සමාලෝචිත වර්ෂයේ දී රු. 3,449 ක් හර කර වර්ෂය අවසාන ශේෂය රු.1,839,420 ක් ලෙස දක්වා තිබුණු නමුත්, එම ශේෂය හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කර ගිණුම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

---------------------------------

වර්ෂ පහකට වැඩි කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශන වල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.182,875 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 04 ක් හා වර්ෂ දෙකකට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකරන ලද රු.2,396,973 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක වටිනාකම් සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම් විෂයයන් 06 කට අදාළ එකතුව රු.4,234,052 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**2 මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

---------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,580,852 ක් වූ අතර, ඊට

ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.2,643,943 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,224,795 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය.

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ)** සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දීමනා ලෙස රු. 10,156,554 ක් ගෙවා තිබූ නමුත්, ඉන් ප්‍රතිපූර්ණය වී තිබුණේ රු. 7,516,900 ක් පමණි. ඒ අනුව සභා අරමුදලින් රු. 2,639,654 ක මුදලක් සභා සේවකයන්ගේ වැටුප් ගෙවීමට වැය කර ඇති බව නිරීක්ෂණය විය.

**(ආ)** <u>මුළු ආදායම් හා මුළු වියදම් අතර අනුපාතය</u>

ඉකුත් වර්ෂයේ තත්ත්වය සමඟ සමාලෝචිත වර්ෂයේ තත්ත්වය සැසඳීමේදී යම් ප්‍රගතියක් දැක්වෙන නමුත්, වර්ෂයේ මුළු ආදායමෙන් සියයට 84 ක් තරම් මුළු වියදම් පැවතීම නිසා සභාවේ ආදායමට සාපේක්ෂව වියදම ඉහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2014.1.1 දිනට හිඟය | 2014 වර්ෂයේ බිල් කිරීම | ලැබිය යුතු මුළු මුදල | වර්ෂයේ බිල් කිරීම් වලින් ලැබීම් | හිඟ ශේෂයෙන් ලැබීම් | මුළු ලැබීම් | 2014.12.31 දිනට හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | (1) | (2) | 3=(1+2) | (4) | (5) | 6=(4+5) | (3-6) |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 77,376 | 260 | 77,636 | 260 | - | 260 | 77,376 |
| බදුකුලී | 727,722 | 1,277,471 | 2,005,193 | 636,511 | 608,268 | 1,244,779 | 760,414 |
| බලපත්‍ර ගාස්තු | - | 242,390 | 242,390 | 242,390 | - | 242,390 | - |
| වරෙන්තු ගාස්තු සහ දඩ මුදල් | 1,353,122 | 1,464,639 | 2,817,761 | 841,255 | 1,353,122 | 2,194,377 | 623,384 |
| | **2,158,220** | **2,984,760** | **5,142,980** | **1,720,416** | **1,961,390** | **3,681,806** | **1,461,174** |

මේ සම්බන්ධයෙන් දැක්වෙන නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) <u>බදු කුලී</u>

සමාලෝචිත වර්ෂයේ දී බිල්කල බදු කුලී ආදායම රු.1,277,471 ක් වුවද, ඉන් අයකරගෙන තිබුණේ රු. 636,511 ක් පමණකි.

(ආ) <u>බලපත්‍ර ගාස්තු</u>

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික වෙළඳ බලපත්‍ර ලබා ගත යුතු ව්‍යාපාර පිළිබඳව සමීක්ෂණයක් සිදුකර නොතිබුණු බැවින් බිල්කළ ආදායම නිශ්චිතව තහවුරු කර ගැනීමට නොහැකි විය.

**2.3.2 වෙනත් ආදායම්**

----------------

වර්ෂ 2000 අංක 53 සහ 1980 අංක 56 දරණ පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වගන්තිය යටතේ පාරිසරික බලපත්‍ර ලබාදී නොමැතිව වී මෝල් (වියළි ක්‍රියාවලි පවතින) 28 කින් පරීක්ෂණ ගාස්තු ලෙස රු.3,000 ක් බැගින් හා පාරිසරික බලපත්‍ර ගාස්තු රු.4,000 බැගින් එකතුව රු.196,000 ක් සමාලෝචිත වර්ෂයේදී අයකර ගෙන නොතිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී අඩුවෙන් ලැබුණු රු.263,406 ක වැටුප් ප්‍රතිපූර්ණ මුදල ලබාගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 සැප්තැම්බර් මස විශ්‍රාම ගිය සභා මුරකරුට රු.24,915 ක වැටුප් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) 1975 පළාත් පාලන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 36 වැනි වගන්තිය ප්‍රකාරව 1993 සැප්තැම්බර් 03 දිනට පෙර විශ්‍රාම ලැබූ පළාත් පාලන සේවයේ විශ්‍රාමිකයන්ගේ දායක මුදල් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,996,975 ක මුදලක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවීමට තිබුණි.

(ඇ) විවිධ ආයතන වලින් ලැබී තිබුණු වාහන 05 ක අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, වාහන 03 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ඉ) කළුගඟ හරස්කර ඉදිකරනු ලබන ජලාශයට ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ජලයෙන් යටවීම නිසා අලුතින් ඉදිවන මහවැලි ව්‍යාපාරය තුළ ප්‍රාදේශීය සභාව සඳහා ගොඩනැගිල්ලක් ඉදිකරමින් පැවතුණි. එබැවින් ප්‍රාදේශීය සභාවට අයවිය යුතු බලපත්‍ර ගාස්තු, වෙළඳ බලපත්‍ර ගාස්තු සහ හිඟ ආදායම් අයකර ගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කිරීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත 17 ක් ඇස්තමේන්තු ප්‍රකාරව නිම කරන ලද බව තහවුරු කෙරෙන මිනුම් වාර්තා ලබා නොගෙන රු. 15,400,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) පහත සඳහන් කර්මාන්ත පිළිබඳ 2015 පෙබරවාරි 07 දින කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| කර්මාන්තයේ නම | ප්‍රතිපාදන මුදල | නිරීක්ෂණය වූ අඩුපාඩු |
|---|---|---|
| -------------------- | --------- | ------------------------ |
| | රු. | |
| කිවුලේ වාඩිය පේරකැටිය පාර සකස් කිරීම | 200,000 | මාර්ගය ප්‍රයෝජනයට ගන්නා බවක් නිරීක්ෂණය නොවීය. |
| නාරංගමුව පල්ලේහේන මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 1,000,000 | වැඩ විෂය අංක 02 යටතේ මාර්ගය සණ මීටර් 51 ක් කොන්ක්‍රීට් කිරීම සඳහා රු.928,863 ක් ගෙවා ඇතත්, යොදා ඇති කොන්ක්‍රීට් පහසුවෙන් කැඩී යන බවත්, ශක්තිය ඉතා අඩු බවත් නිරීක්ෂණය විය. |

| | | |
|---|---|---|
| රණමුරේගම දම්කැටිය කෘෂි මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 1,000,000 | වැඩ විෂය අංක 04 යටතේ සණ මීටර් 33 ක් කොන්ක්‍රීට් කිරීම සඳහා රු.586,707 ක් ගෙවා ඇතත්, එකී මාර්ගයේ යොදා ඇති කොන්ක්‍රීට් ශක්තිමත් බවින් තොර බවත්, පහසුවෙන් කැඩී යන මට්ටමක පවතින බවත් නිරීක්ෂණය විය. |

## 4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

### 4.1 විගණන කමිටු

---------------

ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක සීපීසී/සීඑල්ජී/116 දරන 2014 අගෝස්තු 01 දිනැති චක්‍රලේඛය අනුව සමාලෝචිත වර්ෂයේදී විගණන කමිටු පිහිටුවා ඇතත්, රැස්වීම් පවත්වා නොතිබුණි.

### 4.2 අයවැය පාලනය

----------------

(අ) සමාලෝචිත වර්ෂයේදී අයවැය ලේඛනය මඟින් වැය විෂයන් 26 ක් සඳහා සලසා දී තිබූ රු.423,000 ක ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් කර නොතිබුණි.

(ආ) ආදායම් විෂයන් 07 ක් යටතේ අයකර ගැනීමට ඇස්තමේන්තු කර තිබුණු එකතුව රු.7,982,405 ක් වූ ආදායම් වලින් කිසිඳු මුදලක් උපයාගෙන නොතිබුණි.

ඉහත දැක්වෙන කරුණු අනුව අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 4.3 නොවිසඳී ඇති හා පිළිතුරු නොලත් විගණන විමසුම්

-----------------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී සභාවට ඉදිරිපත් කරන ලද විගණන විමසුම් වලින් විමසුම් 03 ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම් වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනු වල වටිනාකම රු.2,191,134 ක් විය.

**5 පද්ධති හා පාලන**

**-----------------**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) මානව සම්පත් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පාලනය.

(ඊ) වාහන පාලනය